**ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය - 2017**

**------------------------------------------------**

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී,අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කාර්යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 8

මුද්‍රිත මාධ්‍ය ප්‍රචාරණ කටයුතු කිරීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවිය යුතු මුදල් නොගෙවීම මත එම ආයතනය විසින් කාර්යාංශයට එරෙහිව ගොනුගත කර තිබුණු නඩුවට අදාළව එකී පාර්ශවයට කාර්යාංශය විසින් ගෙවීමට සිදුව තිබුණු රු.3,540,661 ක මුදල සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනයන් සිදුකර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේදී එක්සත් රාජධානියේ පැවැත්වූ වෙළඳපල වියදම් (WTM-UK) වලට අදාළ ලැබිය යුතු බදු රු.273,563 ක් පෙර වර්ෂ ගිණුමට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් ගිණුමට බැර කර තිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාර්යාංශය විසින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත ගෙවිය යුතු රු.41,506,650 ක ගොඩනැගිලි කුලිය ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) ජාත්‍යාන්තර ඉන්දියානු සිනමා උළෙල (IFFA) වෙනුවෙන් මිලදී ගන්නා ලද රු.196,800 ක් වටිනා පරිගණක උපාංග ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර තිබුණද ගිණුම්ගත කර නොතිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂය අවසානයට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු ශේෂය ලෙස රු.25,812,532 ක් දක්වා තිබුණු අතර අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් අනුව කාර්යාශයෙන් ලැබිය යුතු ශේෂය ලෙස දක්වා තිබූ ශේෂය රු.18,613,438 ක් වූයෙන් රු.7,199,094 ක පැහැදිලි නොකල වෙනසක් පැවතුණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| (අ) වෙළඳ වියදම් | 345,570,650 | බිල්පත්/ ඉන්වොයිස්පත්/ ඇතුළුඅනෙකුත් උපකාරක ලියවිලිවල සහතික කරන ලද පිටපතේ මුල් පිටපත් |
| (ආ) තනාපති කාර්යාල 08 ක් වෙතැති මුදල් ශේෂ | 3,837,535 | ශේෂ සනාථ කිරීම |
| (ඇ) 2013 වර්ෂයට අදාළව වීන තානාපති කාර්යාලයෙන් ලැබිය යුතු මුදල | 19,731,593 | පූර්ව වර්ෂ ගැලපුම් ලෙස ගැලපීමට පාදක කරගත් බිල්පත් හා වවුචර් වල සහතික කරන ලද පිටපතේ මුල් පිටපත |

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලැබිය යුතු ශේෂ වලින් රු. 5,429,645 ක් වර්ෂ 5 කට වැඩි කාලයක්ද, රු. 871,269 ක් වර්ෂ 03 කට වැඩි වර්ෂ 05 කට අඩු කාලයක් ද, රු. 555,809 ක් වර්ෂ 01 කට වැඩි වර්ෂ 03 කට අඩු කාලයක් සහිත හිඟ ශේෂ වලින් සමන්විත වී තිබුණි.

(ආ) තානාපති කාර්යාල වෙත ප්‍රේෂණය කරන ලද මුදලින් අයවිය යුතු වර්ෂ 03 කට වැඩි ශේෂය රු. 2,388,346 ක්ද, වර්ෂ 01 කට වැඩි වර්ෂ 03 කට අඩු ශේෂය රු. 1,639,082 ක්ද සහ වර්ෂ 01 කට අඩු ශේෂය රු.10,198,038 ක්ද විය.

(ඇ) විවිධ ණයහිමියන් යටතේ දක්වා තිබූ ශේෂවලින් රු.7,844,854 ක් වර්ෂ 05 කට වැඩි කාලයක්ද, රු. 2,351,583 ක් වර්ෂ 02 කට වැඩි 04 ට අඩු කාලයක්ද, රු. 12,070,254 ක් වර්ෂ 01 කට වැඩි 02 කට අඩු කාලයක් සහ සහිත ශේෂවලින් සමන්විත වී තිබුණි.

(ඈ) උපචිත වියදම් යටතේ දක්වා තිබූ ශේෂවලින් රු. 249,168 ක් වර්ෂ 03 කට වැඩි කාලයක්ද, රු.12,992,397 ක් වර්ෂ 02 කට වැඩි වර්ෂ 03 ට අඩු කාලයක්ද, රු. 769,907 ක් වර්ෂ 01 කට වැඩි වර්ෂ 02 ට අඩු කාලයක් සහිත ගෙවිය යුතු ශේෂ වලින් සමන්විත වී තිබුණි.

(ඉ) විවිධ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් වෙනුවෙන් 2016 සිට 2017 නොවැම්බර් දක්වා විදේශ තානාපති කාර්යාල 04 ක් වෙත ලබාදී තිබූ රු.5,453,130ක අත්තිකාරම් මුදල් විගණිත දින වන 2018 සැප්තැම්බර් 30 දින වනවිටත් පියවා නොතිබුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2005 අංක38 දරන සංචාරක කටයුතු පනතේ VII පරිච්ඡේදයේ 40 වගන්තියේ 09 උප වගන්තිය | සෑම ලිත් වර්ෂයක් අවසානවී මාස තුනක් ඉකුත් වීමට පෙරාතුව එම වර්ෂය තුළ කාර්යාංශයේ වැඩ පිළිබඳ වාර්තාවක්,ලිත් වර්ෂයේ මාස හතක් අවසාන වීමට පෙරාතුව අර්ධ වාර්ෂික ගිණුම්,කාර්යාංශය ඉටු කර ගැනීමට අපේක්ෂා කරන ඉදිරි තුන් අවුරුදු කාලසීමාවකට අපේක්ෂිත සැලැස්මක් හා පූර්ව වර්ෂයට අදාලව ඉදිරිපත් කරන ලද සැලසුම් සම්බන්ධයෙන් වූ කාර්ය සාධනය සහ ඉෂ්ඨ කර ගැනීම ඇතුලත් ප්‍රකාශයන් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 1971අංක 38 දරන මුදල් පනතේ 10වගන්තියේ 5 උපවගන්තිය | සමාලෝචිත වර්ෂයේ රු.1,939,846,902 ක අතිරික්තයක් පැවතියද, මුදල් පනතේ විධිවිධානවල සඳහන් මුදල් යෙදවීමෙන් පසු වර්ෂයේ ශුද්ධ අතිරික්ත ආදායමින් ඉතිරි සියලු මුදල් ඒකාබද්ධ අරමුදලට මාරු කල යුතු වුවද එපරිදි කටයුතුකර නොතිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.මිලියන 1,756 ක් කෙටිකාලීන ආයෝජන ලෙස රාජ්‍ය බැංකු වල ආයෝජනය කර තිබූ අතර මේ සඳහා මුදල් ඇමතිවරයාගේ අවසරයද ලබාගෙන නොතිබුණි. |
| (ඇ) මුදල් රෙගුලාසි 102 – 110 දක්වා | වටිනාකම රු. 308,700 ක් වන ලැප්ටොප් පරිගණක තුනක් නැති වීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) මුදල් රෙගුලාසි 169 (2) | චෙක්පත් උපලබ්ධි වීමට පෙර සේවා සපයා තිබීම හේතුවෙන් රු. 1,002,752 ක් වටිනා චෙක්පත් 05 කට අදාළ මුදල් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. |
| (ඉ) මුදල් රෙගුලාසි 757 සහ 2016 මාර්තු 31 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 03/2016 | සමාලෝචිත වර්ෂයට අදාලව ස්ථාවර වත්කම් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

---

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්යාංශයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,939,846,902ක අතිරික්තයක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 1,753,397,939 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.186,448,963 කින් වර්ධනය වී තිබුණි.වෙළඳ වියදම් රු. 238,708,601 කින් වර්ධනය වුවත් සංචාරක සංවර්ධන බදු රු.318,383,615 කින් වැඩි වීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේදී රු. 6,238,009 ක්වූ අතිරික්තය උච්චාවචනයන් සහිතව 2017 වර්ෂය අවසානයට රු.1,939,846,902 ක් දක්වා වර්ධනය වී තිබුණි. සේවක පාරිශ්‍රමික, හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේ දී 2013 වර්ෂයේ රු. 41,362,424 ක් වූ දායකත්වය 2017 වර්ෂය වනවිට රු. 2,048,230,651 දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

### 3.2 කාර්යාංශයට එරෙහිව ආරම්භකර ඇති නෛතික සිද්ධි

---

බාහිර පාර්ශව විසින් කාර්යාංශයට එරෙහිව ගොනුකර තිබූ නඩු 04 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් නොවිසඳී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---

### 4.1 කාර්යසාධනය

---

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ක්‍රියාකාරි සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේදී ලෝකයේ ප්‍රධාන රටවල් 31 ක් තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ අලෙවි ප්‍රවර්ධන ඉසව් ගණන 144 ක් වූ අතර එයින් නිම කර තිබූ සංඛ්‍යාව 109 ක් විය.

(ආ) විදේශ වෙළඳපළ ඉලක්කකර ගනිමින් වර්ෂ කීපයක සිට සමාලෝචිත වර්ෂය දක්වා පවත්වන ලද විවිධ ඉසව් සම්බන්ධයෙන් වූ සංචාරක ප්‍රවර්ධන වියදම, ආදායම සහ පැමිණීම ඉකුත් වර්ෂ හා සැසඳීමේදී වර්ධනයක් පෙන්නුම් කළද, සංචාරක ආදායමේ හා පැමිණීමේ වර්ධන වේගයන්වල අඩුවීමක් සිදුව තිබුණ බව ඉදිරිපත් කරන ලද සංඛ්‍යා දත්ත වාර්තා අනුව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | සංචාරක වියදම රු. මිලියන | සංචාරක ආදායම රු.මිලියන | ආදායම් වර්ධනය % | ආදායම් වර්ධන වේගය % | සංචාරක පැමිණීම | පැමිණීමේ වර්ධනය % | පැමිණීමේ වර්ධන වේගය % |
|---|---|---|---|---|---|---|---|
| 2013 | 472.27 | 221,147 | - | - | 1,274,593 | - | - |
| 2014 | 836.10 | 317,502 | 43.57 | - | 1,527,153 | 19.81 | - |
| 2015 | 646.31 | 405,492 | 27.71 | -15.86 | 1,798,380 | 17.76 | -2.05 |
| 2016 | 675.30 | 512,594 | 26.41 | - 1.30 | 2,050,832 | 14.04 | -3.72 |
| 2017 | 855.18 | 598,356 | 16.73 | -9.68 | 2,116,407 | 3.20 | -10.84 |

(ඇ) සංචාරක ප්‍රවර්ධනය උදෙසා දරන ලද වියදමින් වැඩි ප්‍රතිශතයක් එනම් 80% ක් පමණ ප්‍රධාන රටවල් (විශේෂයෙන් බටහිර රටවල්) සඳහා උපයෝජනය කළද එම රටවල සංචාරක පැමිණීමේ වර්ධන වේගය සමාලෝචිත වර්ෂය වන විට පහත වැටී ඇති බව සංඛ්‍යා දත්ත විශ්ලේෂණයේදී නිරීක්ෂණය වූ අතර විශේෂයෙන් නැගෙනහිර ආසියාතික රටක් වන චීනයෙහි වෙළඳ ප්‍රවර්ධනය සඳහා වාර්ෂිකව ඉහළම වැයක් දැරුවද සමාලෝචිත වර්ෂය වන විට සංචාරක පැමිණීමේ වර්ධන වේගයන් නොමැති රටවල් (සෘණ අගයන් සහිත) අතරින් ප්‍රමුඛස්ථානයක් ගෙන ඇති බවට නිරීක්ෂණය විය.විස්තර පහත දැක්වේ.

| රට | 2016 වියදම රු. මිලියන | 2016 පැමිණීමේ වර්ධන වේගය % | 2017 වියදම රු. මිලියන | 2017 පැමිණීමේ වර්ධන වේගය % |
|---|---|---|---|---|
| ඉතාලිය | 25.31 | 7.58 | 40.32 | -17.14 |
| ජර්මනිය | 49.20 | 2.50 | 71.26 | -17.31 |
| ස්විඩනය | 15.03 | -12.01 | 21.66 | -4.75 |
| ප්‍රංශය | 45.73 | 2.80 | 77.71 | -11.11 |
| එක්සත් රාජධානිය | 144.11 | 4.0 | 114.20 | -8.97 |
| මැද පෙරදිග | 60.50 | -7.07 | 101.96 | -17.70 |
| චීනය | 131.59 | -41.14 | 138.75 | -27.41 |
| ඉන්දියාව | 40.87 | -17.49 | 68.76 | -4.98 |
| ජපානය | 30.72 | 8.96 | 37.01 | -5.17 |
| **එකතුව** | **543.06** | | **671.63** | |

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාත්‍යන්තර නර්තන සැණකෙළිය සඳහා අනුග්‍රාහක දායකත්වය ලබාදීම වෙනුවෙන් කාර්යාංශය විසින් පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුමකට එළඹ රු.1,500,000 ක අත්තිකාරම් 2015 ජූලි 03 දින ගෙවා තිබුණ ද අදාල සැණකෙළිය නොපැවැත් වුවද ගෙවූ අත්තිකාරම් මුදල නැවත අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) කාලච්ඡේදයට අදාල වියදම් හා වර්ෂය අවසානයට ඇති බැඳීම් හඳුනා ගැනීමට නිසි ගිණුම්කරණ ක්‍රමයක් නොමැති වීම හේතුවෙන් 2014,2015 හා 2016 වර්ෂවල විදුලිය, දුරකථන, වෙළෙඳ වියදම්, ගොඩනැගිලි කුලීවලට අදාල එකතු වටිනාකම රු.280,495,439 ක වියදම් 2017 වර්ෂයේදී හඳුනාගෙන අතීතානුයෝගීව ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ස්ථාවර වත්කම් ලේඛනයට අනුව පැවති රු. 8,766,603 ක වත්කම් අයිතම් 50 ක් සම්බන්ධයෙන් එකී වත්කම් කාර්යාංශයේ කිනම් නිළධාරියා/ අංශය භාරයේ පවතීද යන්න දක්වා නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ නිකුත් කළ විගණන විමසුම් 03කට සහ පසුගිය වර්ෂයේ විගණන විමසුම් 02 කට විගණිත දින වන 2018 සැප්තැම්බර් 30 දින දක්වා පිළිතුරු ලබාදී නොතිබුණි.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

--------------------------------

සංචාරක ප්‍රවර්ධන කටයුතු සඳහා විදේශ රටවල ස්ථාපිත ශ්‍රී ලංකා දූත මණ්ඩල වලට අනුයුක්තව වාණිජ දෙපාර්තමේන්තුවේ වාණිජ නිලධාරියෙකු හා ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් (එක්සත් රාජධානියේ වෙළඳපල කටයුතු සඳහා) නිලධාරීන් තිදෙනෙකු පත්කර තිබියදී ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ කලමණාකාරීත්වය විසින් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් නොවූ අධ්‍යක්ෂ තනතුරක් හා සංචාරක ප්‍රවර්ධන නිලධාරි තනතුරක් සඳහා අවිධිමත් පරිදි කොන්ත්‍රාත් හා අනියම් පදනම මත පත්වීම් ලබාදී තිබුණි.එම තනතුරු සඳහා වැටුප්,ප්‍රවාහන, ගෙවල්කුලී, දුරකථන, අතිකාල වැනි දීමනා හා වෙනත් දීමනා වශයෙන් 2008 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ආයතනය වැයකරන ලද රු.179,438,804 ක මුදල අරපිරිමැසුම්දායී නොවන ගෙවීමක් බව නිරීක්ෂණය විය.

## 5. තිරසාර සංවර්ධනය

----------------------

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීම

------------------------------------------------------------

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර "2030 න්‍යාය පත්‍රය" ප්‍රකාරව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් තම විෂය පථයට වැටෙන කාර්යයන් සම්බන්ධයෙන් දැනුවත් වී නොමැති වීම හේතුවෙන් එම කාර්යයක් සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගෙන නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---

### 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත්කර තිබුණේ 2018 ජුනි 29 දිනදීය.

### 6.2 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂයේ කාර්යාංශය විසින් රටවල් 31 ක් තුල විදේශ අලෙවි ප්‍රවර්ධන කටයුතු සිදු කර තිබුණද අභ්‍යන්තර විගණනය රටවල් 02 ක් වෙනුවෙන් පමණක් සිදු කර තිබුණි.

### 6.3 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

---

#### 6.3.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.2.1 (අ), (ආ) සහ (ඇ) වගන්ති ප්‍රකාරව ඉදිරි වර්ෂය සඳහා වූ සවිස්තරාත්මක ප්‍රසම්පාදනසැලැස්ම සමඟ අවම වශයෙන් වසර තුනක් ආවරණය වනසේ ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වුවද එවැනි සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ආ) 2017 සැප්තැම්බර් 26 සිට 29 දක්වා ප්‍රංශයේ පැවැත්වූ ජාත්‍යන්තර ප්‍රංශ සංචාරක වෙළඳපල වෙනුවෙන් වෙළඳ කුටිය නිර්මාණය හා ඉදි කිරීම සඳහා රු.8,239,199 ක් සහ නැටුම් කණ්ඩායමක් සපයා ගැනීම සඳහා රු.1,031,848 ක් අදාල සේවා සපයන්නන් වෙත ගෙවා තිබූ අතර එම ගෙවීම් කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.2 (අ), (ඇ), 2.14.1, 6.2.2 සහ 7.7.1 (අ), (ආ. (i)) වගන්තිවල ප්‍රතිපාදනයන් අනුගමනය කර නොතිබුණි.

### 6.4 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ විෂයයන් 39 ක ඇස්තමේන්තුගත හා තථ්‍ය අගයන් අතර සියයට 21 ක සිට සියයට 100 ක් දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

### 6.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ 2015 වර්ෂයේ වාර්ෂික වාර්තාව විගණිත දිනය වූ 2018 සැප්තැම්බර් 30 දින දක්වාම පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි.

**6.6 නොවිසඳී ඇති විගණන ඡේද**

**--------------------------------**

2016 වර්ෂයේ විගණිත වාර්තාවෙන් පෙන්වා දී තිබූ පහත සඳහන් නිරීක්ෂණ සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් නොවිසඳී පැවතුණි.

(අ) 2014 වර්ෂයේ ලෝක සංචාරක දිනය නිමිත්තෙන් යයි දක්වමින් රු.5,824,000 ක මුදලක් වැයකර මුද්‍රණය කර තිබූ ටීෂර්ට්, එකී සැපයුම් ආයතනයේ අධ්‍යක්ෂකගේ ප්‍රකාශය පරිදි මුද්‍රණයකර තිබුණේ දේශපාලන පක්ෂයක ප්‍රචාරක කටයුත්තක් සඳහා වීම.

(ආ) සංචාරක ක්ෂේත්‍රය තුළ සමාජීය වගකීම් ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා පුද්ගලික ආයතන දෙකකට රු.99,439,900 (බදු රහිත) ක මුදලක් ගෙවා තිබූ නමුත් එකී ගෙවීම් පිළිගත නොහැකි ගෙවීම් බවට නිරීක්ෂණය වීම.

(ඇ) එක්සත් රාජධානියේ පැවැත්වූ වෙළෙඳ ප්‍රදර්ශනයේ “ (WTM) (UK) 2014” වෙළඳ ප්‍රදර්ශන කුටිය ඉදි කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව ලබා දීමේදී මිල කැඳවුම් ලිපි විවෘත කලයුතු දිනට දින 04 කට කලින් විවෘත කිරීම, ටෙන්ඩර්කරු හෝ නියෝජිතයෙක් ටෙන්ඩර් ලිපි විවෘත කරන අවස්ථාවට සහභාගී නොවීම, කොන්ත්‍රාත්කරු බ්‍රිතාන්‍ය තානාපති කාර්යාලය සමඟ ගිවිසුමකට එළඹ එහි පිටපතක් ප්‍රවර්ධන කාර්යාංශය වෙත එවිය යුතු බවට උපදෙස් දී ඇතත් ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර සහ වෙළඳ ප්‍රදර්ශන කුටි සාර්ථකව ඉදිකළ බවට වගකිව යුතු නිලධාරියෙකුගේ සහතිකයක් නොමැතිව එම ඉදිකිරීම සඳහා කාර්යාංශය විසින් රු.17,803,508 ක ගෙවීමක් කාර්යාංශය සිදු කර තිබීම.

(ඈ) චීන මාධ්‍යවේදීන් 12 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ සංචාරක ආකර්ෂණීය ප්‍රදේශ කිහිපයක් ආවරණය වන පරිදි සිදු කළ FAM චාරිකාව සඳහා රු.3,506,757 ක් වැයකර තිබුණු අතර එම චාරිකාව පිළිබඳ වාර්තා චීන මාධ්‍ය මඟින් ප්‍රචාරය කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම.

(ඉ) රුසියාවේ මොස්කව් නුවර පැවති සංචාරක ප්‍රවර්ධන වැඩසටහන (Leisure Travel and Tourism fair – 2014) සඳහා ටීෂර්ට් මිල දී ගැනීම වෙනුවෙන් රු.7,800,000 ක් වැය කර තිබූ නමුත් එකී ටීෂර්ට් තොග ආයතනය වෙත ලැබී නොතිබූ අතර එකී මිලදී ගැනීම් වෙනුවෙන් පිළියෙල කළ ලේඛන පිළිගත නොහැකි වීම.

(ඊ) පිළිගත් ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරව 2010 වර්ෂයේදී ජාත්‍යන්තර ඉන්දියානු සිනමා උළෙල (IIFA) වෙනුවෙන් රු.1,116,000 ක් වැයකර මිලදී ගන්නා ලද ලැප්ටොප් පරිගණක 07 ක් හා ඩෙස්ක්ටොප් පරිගණක 03 ක් ගබඩාවට භාරගත් බවට හෝ නිලධාරීන් අතර බෙදාහැරි බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොකළ අතර ඒවා භෞතික පරීක්ෂාවටද ඉදිරිපත් නොවීම.

**7. පද්ධති හා පාලනයන්**

**---------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර කාර්යාංශයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | උපචිත වියදම් ගිණුම් තැබීම, ලැබිය යුතු ගිණුම් සටහන් කිරීම, ගෙවල් කුලී ගිණුම් තැබීම හා ස්ථාවර වත්කම් ගිණුම් තැබීම සම්බන්ධව අභ්‍යන්තර පාලනයේ අඩුපාඩු පැවතීම සහ උප පත්‍රිකා ලේඛනය පවත්වාගෙන නොයාම. |
| (ආ) අයවැය ලේඛනමය පාලනය | අයවැය සහ තථ්‍ය වියදම්වල සැලකිය යුතු විචලනයන් පැවතීම. |
| (ඇ) මානව සම්පත් කළමනාකරණය | කාර්ය මණ්ඩලය පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම. |
| (ඈ) ප්‍රසම්පාදනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු නොකිරීම. |
| (ඉ) ස්ථාවර වත්කම් පාලනය | කාර්යාංශය ස්ථාවර වත්කම් සියල්ල හඳුනාගෙන ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් නොකිරීම. |